www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: බාටා පාවහන් සමාගමේ වාඩිලෑම සිව් වන සතියට පිවිසෙයි

## Sri Lanka : Bata footwear occupation enters fourth week

**ක්‍රිෂාන්ත ජයසිංහ සහ සමන් ගුණදාස විසිනි**
**2004 ජුලි 19**

500කට අධික බාටා කම්කරුවන් සිය වෘත්තීය සමිති නායකයා යලි සේවයේ පිහිටුවන ලෙස හා සේවකයන් ප්‍රමානය කප්පාදු කිරීමේ සැලසුම් අවලංගු කරන ලෙස ඉල්ලමින් කම්හල වාඩි ලා ඇරඹූ අරගලය සිව් වන සතිය පසු කරමින් තිබේ. කොලඹින් කිලෝමීටර 15ක් පමන දුරින් පිහිටි රත්මලාන කාර්මික ජනපදය තුල දී මෙම වාඩි ලෑම සිදු වූයේ “නරක හැසිරීමේ” චෝදනාව මත සමාගම වෘත්තීය සමිති නායකයා සේවයෙන් පහ කිරීමත් සමග ම ජූනි 22 දා ය.

ඔහු දොට්ට දැමීම, පසු ගිය මාස තුන තිස්සේ බාටා කම්කරුවන්ගේ විරෝධතා උද්ඝෝෂනයට පාත්‍රවූ, සේවකයන් බුරුතු පිටින් දොට්ට දැමීමේ සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා පරිපාලනය හිතාමතා සංවිධානය කල ප්‍රකෝපකරනයකි. සමාගම නියම කල පරිදි ජුලි 7 දින සේවයට වාර්තා කිරීම ප්‍රතික්ෂේප කිරීමෙන් පසු ජුලි 8 දා වාඩි ලා ගෙන සිටින කම්කරුවන් 595දෙනාට ම පරිපාලනය සේවයෙන් පහ කිරීමේ ලිපි නිකුත් කලේ ය.

පෙර දී, එනම් ජූනි 30 දා, සමාගම් භූමිය තුල වර්ජනය දිගට ම පවත්වා ගෙන යාමෙන් එරෙහි වූ කම්කරුවන්ගේ වෘත්තීය සමිතිය වලකා ලීම සඳහා සමාගම දිස්ත්‍රික්ක උසාවියෙන් නිවැරුම් නියෝගයක් ලබා ගති. කෙසේ වුව ද කම්කරුවෝ කම්හල් භූමියෙන් ඉවත් වීම ප්‍රතික්ෂේප කලහ. සමාගම සිය මූල්‍ය හා අලෙවි කටයුතු වාඩි ලූ කම්හල් පරිශ්‍රයෙන් වෙනත් ස්ථානයකට ගෙන ගිය අතර තායිලන්තයෙන් හා මැලේසියාවෙන් පාවහන් ආනයනය කිරීමට කටයුතු යෙදුවේ ය.

ලංකා බාටා පාවහන් සමාගම 1950 ගනන් මුල දී ශ්‍රී ලංකාව තුල ප්‍රාග්ධනය ආයෝජනය කල ප්‍රධාන බහුජාතික සමාගම්වලින් එකකි. කැනඩාව පදනම කර ගත් මෙම සමාගමෙහි සේවකයන් 50,000ක් පමන සිටින අතර රටවල් 68ක ක්‍රියාත්මක වෙයි. ශ්‍රී ලංකාව තුල එය සතුව එක් කම්හලක් ද සිල්ලර වෙලඳ සල් 116ක් ද තොග වෙලඳ සල් 5ක් ද ගබඩා කිහිපයක් ද පවතී.

1990 ගනන්වල දී නිෂ්පාදනයේ භූගෝලීයකරනය තීව්‍ර වීමත් සමග චීනය වැනි වඩා ලාභදායීව නිෂ්පාදනය කරන රටවලින් ආනයනිත පාවහන්වලින් ලාංකික වෙලඳ පොල පිරී ඉතිරී ගියේ ය. දේශීය නිෂ්පාදකයන්ගෙන් මීට එල්ල වූ පීඩනයට ප්‍රතිචාරයක් වසයෙන් පාවහන් ආනයනය සඳහා වූ තීරුබදු සියයට 27.5ක් හෝ කුට්ටමක් සඳහා රුපියල් 100ක් ලෙස ඉහල දැමීමට ආන්ඩුව ක්‍රියා කලේ ය.

මෙම තීරු බදු ආරක්ෂනයට මුවා වෙමින් කම්හලේ කම්කරුවන් ප්‍රමානය අඩු කිරීමට බාටා සමාගම ක්‍රියාත්මක විය. වඩා ලාභදායී පාවහන් සෘජුව ආනයනය කරමින් ඊට සම්බන්ධිතව උපකොන්ත්‍රාත් නිෂ්පාදන ක්‍රමයක් ඇති කිරීමට එය ක්‍රියා කලේ ය. 1970 ගනන්වල හා 1980 ගනන්වල කම්හල තුල සිටි 800ක පමන කම්කරු ප්‍රමානය ශීඝ්‍රයෙන් පහත දැමුනි. කම්කරුවන්ට අනුව 200කට පමන කම්කරු සංඛ්‍යාව පහල දැමීමට පරිපාලනය සැලසුම් කරමින් සිටියේ ය.

බාටා ආයතනයේ උපකොන්ත්‍රාත් නිෂ්පාදන ක්‍රමය පදනම් වන්නේ රත්මලාන අවට පවතින දරිද්‍ර නිවෙස්වලින් ලබා ගත හැකි ලාභ පවුල් ශ්‍රමය (ස්ත්‍රී සහ ලමා ශ්‍රමය) මත ය. සමාගම සිය කොන්ත්‍රාත්කරුවන් හරහා පාවහන් කොටස් බෙදා හැර බොහෝ දුරට කායික ශ්‍රමය උපයෝගි කර ගෙන සම්පූර්නයෙන් හෝ අර්ධ වසයෙන් නිම වූ පාවහන් එකතු කර ගනියි.

2004 මාර්තු 31 දාතමින් කම්කරු කොමසාරිස්වරයා වෙත යැවූ ලිපියක් මගින් කම්කරුවන් 146 දෙනකුගේ සේවය අවසන් කිරීම සඳහා සමාගම ඉල්ලුම් කලේ ය. එහි මෙසේ සඳහන් විය:

“… සමාගමෙහි ව්‍යාපාරික මෙහෙයුම් ආර්ථික වසයෙන් සෞඛ්‍ය සම්පන්නව පවත්වා ගෙන යමින් වෙලඳ පොලෙහි තරගකාරී මිලක් සහතික කර ගැනීම සඳහා මෑත වසරවල දී පාවහන් ආනයනයන් පුලුල් කල සමාගම නිෂ්පාදිතයෙන් කොටසක් පිටස්තරව ලබා ගැනීමට ක්‍රියා කලේ ය. මෙම කටයුතුවල නො යෙදුනා නම් මේ වන විට සමාගමට සිය නිෂ්පාදන කටයුතු පවත්වා ගෙන යාමට නොහැකි වීමට ඉඩ තිබිනි.”

කම්හලේ අංශ දහයෙන් හතකින් ම කම්කරුවන් ඉවත් කරමින් කම්හලේ කම්කරු ප්‍රමානය 659 සිට 513 දක්වා අඩු කරන අතර උපකොන්ත්‍රාත් නිෂ්පාදිතය දෙගුන කර දැනට කම්හලේ නිෂ්පාදිතය මෙන් දෙගුනයක් එමගින් ලබා ගැනීම සමාගමේ උත්සාහය විය. බාටා සමාගමේ පැහැදිලි ඉලක්කය වන්නේ නිෂ්පාදන වියදම් පහල දැමීම සඳහා වැඩිවැඩියෙන් ලාභදායී “ගෘහස්ත” ශ්‍රමය සූරා ගැනීම යි.

මීට පෙර පැවති එක්සත් ජාතික පෙරමුනු (එජාපෙ) ආන්ඩුව හඳුන්වා දුන් ''බඳවා ගැනීමේ හා දොට්ට දැමීමේ'' කම්කරු නීති බාටා සමාගම යොදා ගනියි. මෙම නීතියට අනුව සොච්චම් වන්දියක් දී සේවය අත්හිටුවිය හැකි ය. සේවයෙන් පහ කල කම්කරුවන්ට ලැබෙන්නේ සේවයේ යෙදී සිටි වසරක් සඳහා මාස භාගයක වැටුපට සමාන දීමනාවකි. උපරිම වසයෙන් ගත්ත ද මෙය කම්කරුවකුගේ වසර දෙක හමාරක වැටුප ඉක්මවා නො යන්නකි.

ඉහත දී කම්කරු කොමසාරිස්වරයා කම්කරුවන්ගේ අනුමැතිය ද සහිතව වන්දි මුදල තීන්දු කල අතර, වෙනත් රැකියා අවස්ථාවන් ලබා ගැනීමට ඇති හැකියාව, රැකියාවේ යෙදීම නිසා කම්කරුවා මුහුන දී සිටින සෞඛ්‍යමය ගැටලු, සේව්‍යයාගේ ලාභ හා ආයෝජනය යනාදි කරුනු එහි ලා සැලකිල්ලට භාජන විය.

එජාපෙ ගෙන ආ නීතිය වහා ම කටු ගා දමන බවට අප්‍රේල් 2 මහ මැතිවරන උද්ඝෝෂනය තුල දී එක්සත් ජනතා නිදහස් සන්ධානය (එජනිස) සහතික විය. එජනිසය තුල ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ (ශ්‍රීලනිප) ප්‍රධාන පාර්ශ්වකරු වන ජනතා විමුක්ති පෙරමුනට සම්බන්ධ වෘත්තීය සමිති මෙම නීතිය ඉවත් කිරීමට බල කරමින් එවක දී උපවාසයක් සංවිධානය කලේ ය. සුලුතර ආන්ඩුවක් තනා ගැනීමෙන් අනතුරුව අනෙක් පොරොන්දු සමග එම පොරොන්දුව ද පැත්තකින් තබා ඇත.

මෙම නීතිය ''අත්හිටුවූ'' බව බාටා කම්කරුවන්ගේ උද්ඝෝෂනය මැද දී කම්කරු ඇමති ආතාවුද සෙනෙවිරත්න නිවේදනය කලේ ය. එසේ වුව ද කම්කරු දෙපාර්තමේන්තුවට අනුව නීතිය බලාත්මක ය. ඒ අතරතුර බාටා කම්කරුවන් සේවයෙන් පහ කිරීම පිලිබඳව ආන්ඩුව මුනිවත රකියි.

බාටා කම්හල තුල වසර 22ක් රැකියාව කල සේවකයෙක් *ලෝසවෙඅට* මෙසේ පැවසී ය: ''කම්කරුවන් මේ ආන්ඩුවට තම ඡන්දය දුන්නේ බලයට පැමිනි පසුව සේවය අවසන් කිරීමේ පනත වැනි රුදුරු කම්කරු විරෝධී පනත් අහෝසි කරතැයි බලාපොරොත්තුවෙන් බලය ගැනීමෙන් පැය 24ක් ඇතුලත සේවය අවසන් කිරීමේ පනත ඉරා දමන බවට එජනිස නායකයෝ සහතික වුනා. දැන් ඔවුන් තානය වෙනස් කර තියෙනවා. මේ ආන්ඩුව කෙරෙහි කම්කරුවන්ගේ විශ්වාසය බිඳී ගොස්. එජනිසයට නැවත ඡන්දය දෙන්න කම්කරුවන් උනන්දු වන්නේ නැහැ.''

බාටා කම්කරුවන්ගේ අරගලවල ඉතිහාසය 1957 තරම් ඈතට ඇදී යයි. එම වසරේ දී ඔවුහු සිය ප්‍රථම වැටුප් අරගලය දියත් කලහ. පසු ගිය වසර ගනනාව තිස්සේ දී නොයෙකුත් ''වාම'' වෘත්තීය සමිති ගොඩ නගා ගත් ඔවුහු දැන් නව සමසමාජ පක්ෂයේ නායකත්වයෙන් යුත් සමිතියක සංවිධානය වී සිටිති. ඉහල වැටුප්, පාරිතෝෂික දීමනා හා ජීවන වියදම් දීමනා ලබන ශ්‍රී ලංකාවෙහි කම්කරුවන් අතලොස්ස අතර බාටා කම්කරුවෝ සිටියහ. දුෂ්කර ලෙස දිනා ගත් මෙම කොන්දේසි අතු ගා දැමීමට පරිපාලනය දැන් අරඅදිමින් සිටියි.

බාටා කම්කරුවන් සේවයෙන් පහ කිරීම ශ්‍රී ලංකාව තුල වර්ධනය වන පන්ති ආතතිය ඇඟවුම් කරයි. නිෂ්පාදනයේ භූගෝලීයකරනයත් සමග බාටා වැනි අන්තර් ජාතික සමාගම් සිය වෙලඳ පොල ආරක්ෂා කර ගැනීම හා ලාභය උපරිම කර ගැනීම සඳහා විදුලි සංදේශ, ප්‍රවාහන හා නිෂ්පාදන තාක්ෂනයන්හි වර්ධනයන් යොදා ගැනීමට උත්සාහ දැරී ය. මේ වසර අවසානයේ ඇඟලුම් කෝටා ක්‍රමය අහෝසි වීමත් සමග සියදහස් ගනන් ශ්‍රී ලාංකික ඇඟලුම් කම්කරුවෝ ද සිය රැකියා විනාශ වීමේ තර්ජනයට මුහුන දෙති.

කෙසේ වුව ද නසසප නායකයන් බාටා කම්කරු අරගලය විරෝධතා ක්‍රියාවන් මාලාවක් බවට සිඳුවා ඇත. නසසපය නායකත්වය දෙන වානිජ හා කාර්මික සේවක සංගමය (වාකාසේස) බාටා වෘත්තීය සමිතිය හසුරුවන අතර බාටා වාඩි ලෑමට සහාය සඳහා එහි ශාඛාවන් බලමුලු ගැන්වීමට උත්සාහයක් පවා දරා නැති තරම් ය. බාටා කම්කරුවන් ආරක්ෂා කිරීම සඳහා රට තුල හා ජාත්‍යන්තරව තියුනු අරගලයක් දියත් කරනු වෙනුවට පරිපාලනය හා කම්කරු කොමසාරිස් සමග කරන කේවෙල් කිරීම්වලින් ''සාධනීය ප්‍රතිඵල'' බලාපොරොත්තු වන්නැයි වාකාසේසය වර්ජකයන් පොලඹවා ඇත.

එජනිස ආන්ඩුව නොඉවසිලිමත්ව ආකර්ෂනය කර ගැනීමට උත්සාහ දරන විදේශ ආයෝජන කප්පාදු කරන බැරෑරුම් ප්‍රතිඵල ජනනය වීමට කම්කරුවන්ගේ වාඩි ලෑම තුඩු දිය හැකි යැයි අනතුරු අඟවමින් බාටා පරිපාලනය විදේශ තානාපති කාර්යාලවලට හා ආන්ඩුවට ලියා ඇති බැවින් ''වැඩිපුර ඝෝෂා නො කර'' සිටින ලෙස කම්කරු කොමසාරිස්වරයා තමන්ට දැන්වූ බව බාටා කම්කරුවෝ *ලෝසවෙඅට* පැවසූහ.

බාටා පරිපාලනයේ ඉල්ලීම දෝංකාර නංවමින් වාකාසේසය ද ආන්ඩුවෙන් ඉල්ලා සිටින්නේ ආනයනයන්ගෙන් දේශීය කර්මාන්ත තව දුරටත් ආරක්ෂා කර ගැනීම සඳහා තීරු බදු පැනවීම වැනි නොයෙකුත් ආරක්ෂනවාදී විධික්‍රම යොදමින් මැදිහත් වන ලෙස ය. එනමුදු පසු ගිය වසරේ වාර්තාව මගින් ප්‍රදර්ශනය කෙරෙන අයුරු සමාගම සරලව ම එම පියවරයන් යොදා ගන්නේ ලාභ ආරක්ෂා කර ගැනීමට මිස කම්කරු අයිතීන් ආරක්ෂා කිරීමට නො වේ.

වෘත්තීය සමිතියේ ජාතිකවාදී ඉල්ලීම මගින් පැහැදිලි වන්නේ වෘත්තීය සමිති ව්‍යාපාරයේ ඉදිරි දර්ශනයෙහි පවතින බංකොලොත් බව යි. එහි වැඩ පිලිවෙල බාටා සමාගමේ ශ්‍රී ලාංකික කම්කරුවන් අනෙකුත් රටවල බාටා කම්කරුවන් ද ඇතුලු ඔවුන්ගේ ජාත්‍යන්තර පන්ති සොහොයුරන්ට හා සොහොයුරියන්ට එදිරිව තබයි. එය සහාය දෙන්නේ කම්කරුවන්ගේ රැකියාවන්ට හා ජීවන කොන්දේසිවලට එල්ල කරන භූගෝලීය ප්‍රහාරයන්ට පමනි.

© www.wsws.org